**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත**

9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

**ඒකකය 3 - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**

**පැවරුම් අංක 3 – 5 වන සතිය (2021.06.28-2021.07.02)**

**ක්‍රියාකාරකම 9. 3. 2** - ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු සතු අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් හඳුනාගනිමු

**හැඳින්වීම -** ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුද්ගලයකුට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා සමාජයෙන් හිමි වන පිළිගැනීම් අයිතිවාසිකම් වන අතර අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී අපෙන් සමාජයට ඉටුවිය යුතු කාර්ය භාරය යුතුකම් ලෙස හැඳින්වේ.

**ගුණාත්මක යෙදවුම්** - පුරවැසි අධ්‍යාපනය පෙළ පොත / සටහන් පොත / පෑන් / පැන්සල්

**ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් : -**

පියවර 1 : - නමය ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 73 - 76 දක්වා කියවන්න.

පියවර 2 : - සටහන් පොතේ පැවරුම් අංක දෙක ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් පහතින් සපයා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වේ.)

**පිළිතුරු ලිවීමට පෙළ පොතේ පිටු අංක 73-76 දක්වා උපකාර කරගන්න.**

**ප්‍රශ්නාවලිය**

1. අයිතිවාසිකම් හා යුතුකම් මොනවාදැයි හඳුන්වන්න.
2. පුරවැසියකු සතු විය යුතු අයිතිවාසිකම් සාරාංශ ගත කරන්න
3. ඔබෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකම් දහයක් ලියන්න.
4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි වගන්තියේ සඳහන් වන යුතුකම් තුනක් ලියන්න.
5. සෑම පුද්ගලයකුම අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ යම්කිසි සීමාවන්ට යටත්ව ය. ඒ අනුව රජය විසින් පනවා ඇති එවන් සීමාවන් සඳහා උදාහරණ තුනක් සපයන්න.

**පසු වැඩ**

1. දෙමාපියන්ගෙන් දරුවන්ට හා දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් 5 බැගින් ද
2. ගුරුවරුන්ගෙන් සිසුන්ට හා සිසුන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතුකම් 5 බැගින් ද දක්වා
3. එක් පාර්ශවවල යුතුකම් ඉටු කිරීමෙන් අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

පාසල ආරම්භ වූ වහාම මෙම අභ්‍යාසය පුරවැසි අධ්‍යාපනය විෂයභාර ගුරුභවතාට පෙන්වීමට සලස්වන්න.

ර/ ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ

පුරවැසි අධ්‍යාපන විෂය භාර

ආචාර්ය එම්.ඒ.පත්මලතා මිය